## අවුරුදු පණහක සාමයේ රහස

ජෝර්ජ් අංකල් සහ සැලී ඇන්ටි විවාහ වෙලා හරියටම අවුරුදු 50 යි. ඒ දෙන්න ඒ රත්තරන් ජුබිලිය සමරන්න උත්සවයක් ලෑස්ති කළා. ඒ උත්සවේට ලොකු සෙනගක් ආවා. උත්සවය යද්දි ඒ සෙනග අතර හිටි තරුණ පත්තරකාරයෙක් මේ යුවල ගැන ලිපියක් ලියන්න හිතාගෙන හෙමින් ජෝර්ජ් අංකල් ළඟට කිට්ටු වෙලා මෙහෙම ඇහුවා.

“ අංකල් ඇහුවට තරහවෙන්න එපා.... ඔය දෙන්නා අවුරුදු 50ක් එකට හරි සන්තෝසෙන් හිටියයි කියලා කියනවනේ... ඉතින් මේ කාල සීමාව ඇතුළත හැබැටම කිසිම පවුල් ආරවුලක් හෙම වුණේ නැද්ද...? ”

“ බැඳපු අළුත නම් දවසක් ඉතින් පුංචි බහින් බස්වීමක් වුණා... එච්චරයි.... ඊට පස්සෙ ඉතින් අද වෙනතුරු මුකුත් නෑ.... පුල් සාමෙන් තමයි මේ අවුරුදු පණහම....”

“ අනේ ඒ සිද්ධිය ගැන විස්තර ටිකක් කියන්නකෝ....” තරුණ මාධ්‍යවේදියා ජෝර්ජ් අංකල්ට කරදර කළා....

“ මට ඒ කාලෙ අශ්වයො දෙන්නෙක් හිටියා..... මමයි මගේ බිරිඳයි උන්ගෙ පිට උඩ නැගලා යනවා කැලේ ඇතුළට සත්තු බලන්න.... එහෙම ගිය එක දවසක මගේ බිරිඳගෙ අශ්වයගෙ පය පැටළිලා ඌ බිම වැටුණා.... බිරිඳත් ඉතින් බිම වැටුණා.... ඇය අශ්වයා දිහා බලලා කිව්වා. “ අශ්වයෝ.... ඔය උඹේ පළවෙනි චාන්ස් එක...” කියලා....

ආයෙමත් ටික දුරක් යනකොට අශ්වයා ආයිත් බිම වැටුණා. එතකොට මගේ බිරිඳ අශ්වයාට කිව්වා “ ඔය දෙවෙනි චාන්ස් එක.”. කියලා.

සත්තු බැලිල්ල අමතක කරලා අපි ආයිත් කැලෙන් එළියට එන්න පටන්ගත්තා... එතකොටම අශ්වයා ආයිත් හතර ගාතෙන්ම බිම වැටුණා. එතකොට මගේ බිරිඳ සැලී වචනයක්වත් කතා නොකර එයාගෙ පිස්තෝලෙ ඇදලා අරන් අශ්වයාගෙ ඔළුවට වෙඩි දෙක තුනක් එල්ල කළා... ඌ එතනමයි....

මම සැලීට කෑගහල බැන්න... ඒ කරපු වැඩේ වැරදියි කියලා... එතකෙට එයා කියපු දෙයින් අපේ ජීවිතේ අවුරුදු පණහක්ම කිසිම ආරවුලක් නැතුව මේ දක්වාම සමාදානෙන් ආවා. ඔන්න ඕක තමයි පුතා තමයි අපේ පවුල් ජීවිතයේ සාමයේ රහස...”

“ ඉතින් මොකක්ද ඒ ඔබ ඇයට කෑගහපු වෙලාවෙ ඇය කිව්වාය කියන දේ ? ” මාධ්‍යවේදියා නොයිවසිල්ලෙන් ඇහුවා.

“ පුතා එයා කිව්වා.... “ ජෝර්ජ්.... ඔය පළවෙනි චාන්ස් එක....” කියලා

ලිහිණියා LIHINIYA

ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල

ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප

පිට්ටු, රොටි කොත්තු, බුරියානි

උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.

කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන

ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන

බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි

Tel. 0208 450 9052

66 Cricklewood Broadway, London NW2 3EP

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට

වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ ට්‍රයිකෝ - කොළඹ

50 සිරිල් සී පෙරේරා මාවත

කොළඹ 13

දුරකතනය 448270 /432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්

ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.

දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

TRICO

Shipping & Forwarding Ltd

555 White Hart Lane

London N17 7RP

Telephone 0208 888 8787

Fax 0208 889 5445

E-Mail : trico@tricoshipping.com

නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## අපි දෙන්නම එකයි !

රැකියාවක් සොයාගෙන නගරයට ගිය තරුණයෙක් එහි වූ සර්කස් කණ්ඩායමක් දැක එහි ගොස් මැනේජර් හමුවීය. දැනට රැකියා කිසිවක් නැතැයි කී මැනේජර් මෙසේ ද කීය.

“ අපි ළඟ හිටපු ගොරිල්ලා ගිය සතියෙ මැරුණා.... කවුරුවත් තාම ඒ බව දන්නෙ නෑ.... සෙනග වැඩිපුරම ඇදෙන්නේ ගොරිල්ලා බලන්න.... අපි මැරිච්ච ගමන් උගේ හම ගලවා ගත්තා.... තමුසෙ ඒ හම ඇතුළට බැහැල කූඩුව ඇතුළට වෙලා හිටියොත් කවුරුත් හිතාවි මේ අර ගොරිල්ලමය කියලා.... ඒක තමයි දැනට දෙන්න පුලුවන් ජොබ් එක......”

ඊට කැමති වූ තරුණයා ගොරිල්ලාගේ හම තුලට බැස කූඩුව ඇතුළත ඔබ මොබ ඇවිදිද්දී සර්කස් එකේ කොටියා දුවගෙන විත් කූඩුව තුළට පැන ගොරවන්නට වීය. එවිට “ බුදු අම්මෝ.... මාව බේරගනියෝ......” කියමින් ගොරිල්ලා කෑ ගසන්නට වීය. කොටියා කිට්ටු වී මෙසේ කීවේ ය.

“ කෑ නොගහ හිටපිය යකෝ.... තෝ හන්දා දැන් මාවත් අහුවෙනවා.....”

## ඇස්වලට සහනය

ඇස් දොස්තර තැන තමා වෙතට එන ඇස් ලෙඩුන්ට ප්‍රතිකාර කිරීමේදී කොඩ්ලිවර් ඔයිල් හෙවත් මෝර තෙල් භාවිතා කළේය. එය පැරණි වෙදකමකි. දිනක් ඇහැට බෙහෙත් ගැනීමට පැමිණි කාන්තාවකට රෑට නින්දට යෑමට පෙර කොඩ්ලිවර් ඔයිල් බිංදු දෙකක් ඇසට දමන ලෙස ඔහු නියම කළේය.

කීප දිනකට පසු දොස්තර මහතා තමා හමුවීමට පැමිණි එම කාන්තාවගෙන් ගුණ අගුණ විමසමින් දැන් කිසියම් වෙනසක් දැනෙනවාදැයි ඇසීය.

“ අම්මෝ ඔව්!.... අද උදේ දැනුණේ පුදුම වෙනසක්....” ඇය දොස්තරට කරුණු පැහැදිලි කළාය. “ ගෙදර ඉන්න පූසා ඇවිත් ඇහැ ලෙවකන්න පටන් ගත්තු නිසා මට වෙනදට කලින් ඇහැ ඇරුණා....”

## තරහ පාලනය කිරීම

ගෙදර ඇතිවූ බහින් බස්වීමකදී බිරිඳට තදින් බැණ වැදුණු සැමියා තරහ නිවුණු පසු ඇයගෙන් මෙසේ විමසුවේ ය.

**සැමියා** - මම කොච්චර කෑගැහුවත්, බැන්නත් ඔයා එකට එක කියන්නේ නෑ, තරහ ගන්නෙ නෑ, කොහොමද එහෙම ඉන්නෙ.

**බිරිඳ** - මට ඔයා බනින කොට මම ගිහින් ටොයිලට් එක මැදලා හෝදනවා. එතකොට මගේ තරහ නිමෙනවා.

**සැමියා** - ටොයිලට් එක මැද්දම කොහොමද තරහ නිමෙන්නෙ?

**බිරිඳ** - ඇයි මම ඔයාගෙ දත් බුරුසු- වෙන් නේ ඒක මදින්නෙ!

## මුහුණ නොපෙනීම

මහාචාර්යවරයෙක් තම වෛද්‍ය ශිෂ්‍යයෙකුගේ අවසාන පරීක්ෂණයේ දී මෙසේ ඇසී ය.

“ ශල්‍යකර්මවලදී ශල්‍යවෛද්‍යවරුන් මුහුණු ආවරණ පළඳින්නේ ඇයි.....? ”

“ ඔපරේෂන් එකේ දී කිසියම් දෝෂයක් ඇතිවුනොත් ඒක සිදුකළ කෙනාව අඳුරගන්න බැරිවෙන්න......” ශිෂ්‍යයා පිළිතුරු දුන්නේ ය.

ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.

ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 13 ක චෙක්පතක් *Lanka Viththi* යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.

Lanka Viththi
P. O. Box 64678,
London NW3 9LS

## ගියෙ ඇයිද? මාව තනිකර හර්දේ දුකක් මචා!

දවසක් හවස් යාමයේ සුසානභූමියක් අයිනෙන් වැටිල තිබුණු පාරක් දිගේ මම යනකොට ඒ කනත්ත පැත්තෙන් මහ අදෝනාවක් එක්ක ඉකිගහන හඬක් ඇහුණා. හොඳට කන් දුන්නම මට මේ වචනත් ඇහුණා.

“ අනේ ඇයි ඔහේට ඔය විදියට යන්න සිද්ධ වුණේ ? ”

ඒ දුක්මුසු හඬ ඇහුණම මට යන්න ආ ගමනත් එපා වුණා. මම හෙමින් කනත්තට ඇතුල්වුණා. සොහොන් කොත් මිනීවළවල් අතරින් මම ඒ අදෝනාව ආපු පැත්තට හෙමිහිට ගමන් කළා.

ඇත්තටම, එක මිනී වළක් ළඟ බිම දණගහගෙන, කෙට්ටු අසරණ පෙනුමක් ඇති මැදිවියේ පිරිමියෙක්, ඇස්වල කඳුළු පුරවගෙන අඬනවා, වැළපෙනවා.

“ අනේ ඇයි ඔය විදියට යන්න සිද්ධ වුණේ ?” ඔහු නොනවත්වාම කියනවා.

“ මේ ඔහේගෙ බිරිඳ වෙන්න ඇති ” මම ඉතා කාරුණික විදියට ඒ තැනැත්තගේ ළඟට කිට්ටුවෙලා ඇහුවා.

ඔහු ඔළුව දෙපැත්ට වැනුවා. ‘නෑ’ කියන බව අඟවන්න.

“ එහෙනම් කවුද ? ” මම ආයිත් ඇහුවා.

ඔහු අඬ අඬා මෙහෙම කිව්වා.

“ මේ මගේ වයිfප්ගෙ කලින් හස්බන්ඩ් ! ”

## The Mexican Vampire Woman
## මැක්සිකෝවේ පච්ච යක්ෂණිය





ඉස්සර සහ දැන්
Then & Now
Maria Jose Cristerna

Mexican tattoo star Maria Jose Cristerna, better known as Female Vampire, poses during the Venezuela Tattoo Expo in Caracas, in January 2012. She is a 35-year-old attorney. 98 percent of her body is covered in tattoos. She also has prosthetic fangs, and platinum implants in her forehead. "The Vampire Woman' title was given to her by a one of Mexico’s major TV stations.

" It doesn't necessarily bother me because it has helped me transcend to a new level” she said.

“ Yes, I do like vampires but they are only a dream, a fantasy."

She says the body modification project was a form of self-expression she sought after being the victim of domestic violence in a former marriage.

මේ තරුණ කාන්තාවගේ නම මාරියා ජෝස් ක්‍රිස්ටර්නා ය. එහෙත් මෙක්සිකෝවේ ඇය හඳුන්වන්නේ ඩ්‍රැකියුලා කතා වල සිටින ලේ උරා බොන යක්ෂණිය හා සමාන කරමින් වැම්පයර් ගැහැණිය යනු වෙනි. එහෙත් ඒ නම් පටබැඳීම ඇය ගණන් නොගනී. 35 වියැති මාරියා තුන් දරු මවකි. නීතිඥවරියකි. එහෙත් ඇය නීතිඥ වෘත්තිය අතහැර පච්ච කොටන ස්ටුඩියෝවක් පවත්වාගෙන යයි. ඇගේ කටේ යකුන්ගේ වැනි දළ දෙකක් සවිකර ඇත. නළල දෙපසද අං දෙකක් මෝදු-කරවා ඇත. ඇගේ සිරුරේ 98%ක්ම වැසී ඇත්තේ පච්ච වලිනි. පසුවුණු ජනවාරි මස ඇය මෙක්සිකෝවේ පැවති ලෝක පච්ච ප්‍රදර්ශනයට පැමිණ සිටියේ මෙසේ ය. යොවුන්වියේ හැඩට සිටි තමා මෙවැනි විපර්යාසයකට යොමුවුණේ ප්‍රථම කසාදයේ සැමියාගෙන් අධික හිංසා පීඩා ලැබුණු නිසා තමාට ආත්ම විශ්වාසයක් ඇතිකර ගැන්මේ අදහසින් බව පවසයි.

SHANTHI & CO ❋❋❋❋❋
Solicitors & Commissioners for Oaths

We are an established law firm in North London

Specialising in Immigration matters (Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
♦ General Litigation (Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka

*Contact*:- **Shanthi Senadheera** (*Solicitor*) **Padmini Senadheera** (*Solicitor*) **Dinu Senadheera** (*Solicitor*)

206 Seven Sisters Road, Finsbury Park, London N43NX
Tel. 020 7561 9494 Fax 020 7561 9495
Emergency: 07956 129 642 shanthi.co@btconnect.com